174

# මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

**மகாவலி ,கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சு**

**Ministry of Mahaweli, Agriculture, Irrigation and Rural Development**

**(කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / Agriculture Division)**


අංක. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.
No. 288, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.


| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. 7/1/4/10/කා/පො/නි/ප්‍ර | ඔබේ අංකය. / உமது இல. / Your No. | දිනය. / திகதி. / Date. 2020.3. 18 |

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,
මහවැලි අධ්‍යක්ෂ ජනරාල්,
වාරි කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්,
පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්,

**<u>පොහොර සහනාධාර වැඩසටහන යටතේ වී වගාව සඳහා පරිසර හිතකාමී පොහොර නිකුත් කිරීමේ චක්‍රලේඛය - ( 1/EFF/2020)</u>**

1. වත්මන් රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව කෘෂි කර්මාන්තයේදී මිනිසුන්ට, සතුන්ට මෙන්ම පරිසරයටද හානිදායක වන රසායනික පොහොර අධික ලෙස භාවිත කිරීම වෙනුවට සිය වගාවන් සඳහා ඉහල ගුණාත්මක භාවයෙන් යුතු පරිසර හිතකාමී පොහොර වර්ග භාවිතයට ගොවීන් හුරු කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කල යුතු වේ.
2. මේ සඳහා මෙම විෂය සම්බන්ධ ප්‍රාමාණික උගතුන්ගේ උපදෙස් ලබා ගන්නා ලද අතර අදාල පර්යේෂණ ආයතන වලද සහයෝගයද ලබා ගන්නා ලදි. මේ අනුව 2020 යල කන්නයේ සිට තෝරාගත් ගොවිජන සේවා මධ්‍යස්ථාන බල ප්‍රදේශයන් කීපයක පමණක් නියමු ව්‍යාපෘතියක් ලෙස පරිසර හිතකාමී පොහොර සහනාධාර වැඩපිලිවෙල යටතේ නොමිලේ ලබා දෙනු ලැබේ. මේ සඳහා ගුණාත්මක බවින් ඉහළ පරිසර හිතකාමී පොහොර නිෂ්පාදකයන් පමණක් සැපයුම්කරුවන් ලෙස තෝරා ගනු ලබන අතර සැපයුම්කරුවන් විසින් තමාම තම නිෂ්පාදන පහසුවෙන් ප්‍රවාහනය කර දිය හැකි හා ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධීකරණය කල හැකි ප්‍රදේශ පමණක් තෝරා ගනු ඇත.
3. නියමිත දිනට ගොවීන්ට පරිසර හිතකාමී පොහොර ලබා දීම හා එකී පොහොර වර්ග වල ප්‍රමිතිය උසස් මට්ටමින් පවත්වාගෙන යාම තහවුරු කර ගැනීම මගින් ඉහත ඉලක්කය ගොවිබිම් තුල සපුරා ගැනීම මෙම වැඩසටහනෙහි මුඛ්‍ය පරමාර්ථ වන බැවින් සියළුම රාජ්‍ය ආයතන එක්ව මනා සහයෝගයෙන් කටයුතු කිරීම අවශ්‍ය වේ.

නීල් බණ්ඩාර හපුහින්න
ලේකම්
මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ
ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

පිටපත්:

1. මහවැලි ,කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන, ගරු අමාත්‍යතුමා ඇතුළු සියළු ගරු කැබිනට් අමාත්‍යවරු
2. ලේකම්, මුදල් ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

3. ලේකම්, රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
4. ලේකම්, නාගරික සංවර්ධන හා ජල කළමනාකරණ අමාත්‍යාංශය
5. රාජ්‍ය ලේකම්, මහවැලි, කෘෂිකර්ම, ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය
6. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව
7. ලේකම්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
8. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
9. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
10. අතිරේක ලේකම් (කෘෂි තාක්ෂණ), කෘෂිකර්ම අමාත්‍යාංශය
11. අතිරේක ලේකම් (සංවර්ධන), කෘෂිකර්ම අමාත්‍යාංශය
12. ප්‍රධාන ගණකාධිකාරි, කෘෂිකර්ම අමාත්‍යාංශය
13. සියලුම ප්‍රාදේශිය ලේකම්වරුන්
14. ප්‍රධාන අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම අමාත්‍යාංශය
15. සභාපති, කෘෂිකර්ම හා කෘෂි රක්ෂණ මණ්ඩලය
16. අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලය
17. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්